# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 5 ශ්‍රේණිය - පරිසරය ( ඔක්තෝබර්-4 සතිය )

## 14 තේමාව - අපට කළහැකි වෙනස්කම්

❖ ක්‍රියාකාරකම 1

ඔයාලා දන්නවා ද? අපද්‍රව්‍ය පිළිස්සීමෙන් වායුගෝලයට පිළිකාකාරක වායු එකතු වේ. අහිතකර කිරණින් අපව ආරක්ෂා කරන ඕසෝන් ස්ථරයට හානි සිදුවේ. එම නිසා මෙම අපද්‍රව්‍ය වලට සිදුකළ යුත්තේ කුමක් ද? කියා නිවසේ අය සමඟ සාකච්ඡා කරන්න.

❖ ක්‍රියාකාරකම 2.

දුවේ, පුතේ අපි විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ලෙස හැඳින්වූයේ භාවිතයෙන් ඉවත්කරන ලද බැටරි, ජංගම දුරකථන, පරිගණක උපාංග, CFL බල්බ වැනි දේය. මේවා එකතු කරන මධ්‍යස්ථානවලට භාරදීම හැර වෙනත් කිසිම ක්‍රමයකට ඒවා බැහැරකිරීම සිදු නොකළ යුතුය.

දුවේ පුතේ, ඔබ ප්‍රදේශයේ උත්සාහයෙන් දියුණු වූ පුද්ගලයින් සිටීද යන්න නිවසේ වැඩිහිටියන්ගෙන් අසා දැනගන්න. ඒ අය ගැන තොරතුරු ද ඔවුන්ගෙන් අසා දැනගන්න.

❖ ක්‍රියාකාරකම 3.

ඔබ නිවසේ භාවිතා කරන අපද්‍රව්‍ය වෙන්කිරීමෙන් පොලිතීන් ප්ලාස්ටික් වැනි දේවල් භාවිතය අඩුකිරීමට කළයුතු දේවල් පිළිබඳව නිවසේ අය සමඟ සාකච්ඡා කර ඒ සඳහා ප්‍රයෝජනයට ගතහැකි වෙනත් දේවල් පිළිබඳව ඔවුන්ට යෝජනා ඉදිරිපත් කරන්න.

- ඔබ නිවසේ භාවිතයෙන් පසු ඉවත්කරන අපද්‍රව්‍ය හෙවත් බැහැරකරන සියලුම දේ අඩංගු ලැයිස්තුවක් සාදන්න. (ඒවා ප්ලාස්ටික්, පොලිතීන් දිරන/ නොදිරන ආදී වශයෙන් වෙන්කරන්න.